

# පෝතක බාලදක්ෂ වැඩ සටහන

**ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**

පෝතක බාලදක්ෂ හා වැඩ සටහන් අංශයේ ප්‍රකාශනයකි

# පෝතක බාලදක්ෂ වැඩ සටහන

குருளைச்சாரணர்
திறமைகாண் சின்னங்களுக்கான
பாடத்திட்டம்

# CUB SCOUT PROGRAMME



ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02

පළමු මුද්‍රණය 1987
දෙවන මුද්‍රණය 1996
තුන්වන මුද්‍රණය 2002
හතරවන මුද්‍රණය 2006
සංශෝධිත මුද්‍රණය 2019
සංශෝධිත මුද්‍රණය 2021

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

*මුල් පිටුව සහ ග්‍රැෆික් නිර්මාණය*
*එච්.චාමර සඳරුවන් කල්දේරා*
*සහය මූලස්ථාන කොමසාරිස්*

## පෝතක බාලදක්ෂ පොරොන්දුව
## குருளைச்சாரணர் சத்தியப்பிரமாணம்
## CUB SCOUT PROMISE

මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට ද
පෝතක බාලදක්ෂ නීතියට කීකරු වීමට ද
දිනපතා යහපත් වැඩක් කිරීමට ද
මාගේ සම්පූර්ණ උත්සාහය යෙදීමට පොරොන්දු වෙමි

எனது மதம் மற்றும் நாட்டிற்கு கடமைகளை
நிறைவேற்றுவதற்கும்
சாரண விதிகளுக்கு கீழ்ப்படிவதற்கும்
தினம்தோறும் நற்பணியொன்றை செய்வதற்கும்
எனது முழுமையான முயற்சியில் ஈடுபடுவேன் என்று
உறுதியளிக்கின்றேன்.

I PROMISE TO DO MY BEST,
TO DO MY DUTY TO MY RELIGION AND COUNTRY,
TO OBEY THE CUB SCOUT LAW,AND
TO DO A GOOD DEED EVERY DAY.



## CUB SCOUT LAW

1. පෝතක බාලදක්ෂයා ආකේලාට කීකරු වෙයි
குருளைச்சாரணர் ஆகேலாவுக்கு கீழ்ப்படிவார்
THE CUB SCOUT OBEYS AKELA

2. පෝතක බාලදක්ෂයා ප්‍රයෝජනවත් අයෙක් වෙයි
குருளைச்சாரணர் பயனுள்ளவாராக இருப்பார்
THE CUB SCOUT MAKES HIMSELF USEFUL

3. පෝතක බාලදක්ෂයා වඩාත් හොඳින් කිරීමට යත්න දරයි
குருளைச்சாரணர் மிக நன்றாக செய்வதற்கு முயற்சிப்பார்
THE CUB SCOUT KEEPS TRYING TO DO BETTER

# අධ්‍යාපන අරමුණු හය

| අංකය | අධ්‍යාපනික අරමුණු | පරමාර්ථ |
|---|---|---|
| 01. | **කායික**<br>*Physical* | සෞඛ්‍ය සම්පන්නව සිටීමට අවශ්‍ය වන යහපත් පුරුදු සරල විනෝදාත්මක ක්‍රියාකාරකම් මගින් අවබෝධ කර ගනියි. |
| 02. | **බුද්ධිමය**<br>*Intellectual* | විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අනාගත ආයෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණයට දැනුම ලබාගැනීම පිණිස විනෝදාත්මක කුතුහලයෙන් යුතු සරල ක්‍රියාකාරකම් මඟින් අවස්ථා සලසා ගනියි. |
| 03. | **චිත්තවේග**<br>*Emotional* | සමීප සබඳතාවයන්ගේ පැවැත්ම ගෞරවණීය ලෙස ආරක්ෂා කිරීමට අවශ්‍ය පුහුණුව විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් හුදුනා ගනියි. |
| 04. | **සමාජීය**<br>*Social* | සමාජ සාරධර්ම පිළිබඳව ප්‍රාථමික දැනුම විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් අනුගමනය කරයි. |
| 05. | **ආධ්‍යාත්මික**<br>*Spiritual* | නිර්මාණශීලි ක්‍රියාකාරකම් මගින් ආගමික හර පද්ධතීන් පිළිබඳව සරලව අවබෝධ කරගනියි. |
| 06. | **සංස්කෘතික**<br>*Cultural* | සමාජ පැවැත්මට පාදක වන සංස්කෘතික අංශයන් පිළිබඳව සුමටව සරල ක්‍රියාකාරකම් ඔස්සේ අනුගමනය කරයි. |


# පෝතක බාලදක්ෂ ප්‍රගති පදක්කම් මාර්ගය

## රන් තරුව



අවශ්‍යතා 22
අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 3 කි.

## රිදී තරුව



අවශ්‍යතා 24
අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 2 කි.

## ලෝකඩ තරුව



අවශ්‍යතා 23
අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 1 කි.

## සාමාජික පදක්කම

10 අවශ්‍යතා

# පෝතක බාලදකෂ ගීතය

මුළු ලොවම අපේ - මව්බිමත් අපේ
අපි වෙමු එහි නායකයෝ
මල් සුවඳ දිදී ගුණරුවින් සැදී
අපි වෙමු හොඳ පෝතකයෝ....


සැම විරිය කරමි - ඉටු කරනු රිසින්
යුතුකම් රට දැයට අපේ
රැළ එකතු වෙමින් පියනගමු තුටින්
බී පී නම රැඳුනු මගේ

මුළු උලහුම් එමදේ
තායි නාඩුම් එමදේ
ආහිඩූවෝම් අදන් තලෛවර්හල්
මලර් වාසමුඩන්
නටිගුණංගලුඩන්
ආහිඩුවෝම් ඉලම් සාරණර්හල්


අද පෝතකයෝ හෙට නායකයෝ
සුදු පියුම් විලස පිපෙනා
වෙමු දායකයෝ රට ගොඩ නගනා
සමගිය බලයයි වටිනා.......



# පෝතක බාලදක්ෂ නිල ඇඳුම (බාලක)



# පෝතක බාලදක්ෂ නිල ඇඳුම (බාලිකා)



# පෝතක බාලදක්ෂ සාමාජික පදක්කම

## පෝතක බාලදක්ෂ සාමාජික පදක්කම සඳහා අවශ්‍යතා
## වයස අවුරුදු 7 - 11 දක්වා

### පෝතක බාලදක්ෂයා පහත සඳහන් කරුණු දැන ගත යුතුය

01. **පෝතක බාලදක්ෂ පොරොන්දුව**
    පෝතක බාලදක්ෂ පොරොන්දුව දැන ගැනීම.
02. **පෝතක බාලදක්ෂ නීතිය**
    පෝතක බාලදක්ෂ නීතිය දැනගැනීම.
03. **ආදර්ශ පාඨය**
    පෝතක ආදර්ශ පාඨය ප්‍රකාශ කිරීමට දැන ගැනීම.
04. **හුරුබුහුටිකම**
    සිරුවෙන් සිටීමට හා පහසුවෙන් සිටීමට දැන ගැනීම.
05. **ආචාරය හා අතට අත දීම**
    පෝතක බාලදක්ෂ ආචාරය හා අතට අත දීම
06. **ගෞරව ඝෝෂාව**
    ගෞරව ඝෝෂාව නිවැරදිව කිරීමට දැන ගැනීම.
07. **වන කථාව**
    මවුග්ලි රැළට ඇතුළත් වීම දක්වා වන කථාව දැන ගැනීම.
08. **යහපත් වැඩය**
    තමා කළ යහපත් වැඩක් ආකේලාට වාචිකව ඉදිරිපත් කිරීම.
09. **හානියෙන් සුරක්ෂිතතාව**
    සාමාජිකත්වය සඳහා පසු පිටෙහි දක්වා ඇති සාමාජික පදක්කමට අදාළ හානියෙන් සුරක්ෂිතතාව අවශ්‍යතා සපුරාලීම.
10. **රැළට බැඳීමෙන් පසු මාස 2ක සහභාගීත්වය**
    පෝතක බාලදක්ෂයා මෙම අවශ්‍යතා සාර්ථක ලෙස සපුරා ඇති බවට සහතික කර සාමාජික පදක්කම සඳහා නිර්දේශ කරනුයේ පෝතක බාලදක්ෂ නායකයා හෝ නායිකාව විසිනි

# ලෝකඩ තරුව ප්‍රදානය

## ලෝකඩ තරුව ප්‍රදානය සඳහා අවශ්‍යතා
## වයස අවුරුදු 7 මාස 2 සිට අවුරුදු 11 දක්වා

01. **කැටයකට මුදල් එකතු කිරීම**
සාමාජිකත්වය ලබා ගත් දිනයේ සිට ලෝකඩ තරුව ලබා ගන්නා තෙක් ක්‍රමානුකූලව කැටයක මුදල් එකතු කිරීම.

02. **විවිධ ආගම් පිළිබඳ දැනුම**
ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ආගම් හතරේ නම්, ඒවායේ සංකේත හා ප්‍රධාන ආගමික ස්ථාන නම් කිරීමට හැකි වීම.

03. **සතුටු සේවය**
රැළ සමඟ සරල සතුටු සේවාවකට සහභාගී වීම.
උදා :- පන්ති කාමරය පිරිසිදු කිරීම/ පුස්තකාලයකට පොත් පරිත්‍යාග කිරීම/ මල් පාත්ති සැකසීම.

04. **පිරිමි ගැටය**
පිරිමි ගැටය නිවැරදිව ගැට ගැසීමට හා එහි ප්‍රයෝජන දැන ගැනීම.

05. **ඔරලෝසුව බලා වේලාව කීම**
ඔරලෝසුවක් සාදා අවම වශයෙන් අවස්ථා 4 කදී වේලාව කීමට හැකිවීම.

06. **පාවහන් පිරිසිදු කිරීම**
තමන් භාවිතා කරන සපත්තු පිරිසිදුව තබා ගැනීම.(හැකි නම් පොලිෂ් කිරීම)

07. **කර ලේන්සුව**
කර ලේන්සුව පැළඳීම හා නවා තැන්පත් කර තැබීමට දැන සිටීම.

08. **සරල අත්කමක් හෝ චිත්‍රයක් නිර්මාණය කිරීම.**
සරල අත්කමක් හෝ චිත්‍රයක් නිර්මාණය කිරීම. (පසු දිනයක ප්‍රදර්ශනයක් ලෙස පැවැත්විය හැකිය.)

09 . **ජාතික ගීය**
ජාතික ගීය වාදනා කිරීම හා ගායනා කරන අවස්ථාවේ සිටිය යුතු නිවැරදි ඉරියව් දැන සිටීම

**10. නිරීක්ෂණය**

තම ප්‍රදේශයේ තිබෙන මල් වර්ග 3ක් හා කුරුල්ලන් 3 දෙනෙකු නිරීක්ෂණය කර ඒ පිළිබඳව ආකේලාට වාචිකව වාර්තා කිරීම.

**11. රංගනය**

ආකේලා ඉදිරියේ සතෙකුගේ ගමන් විලාසයක් හෝ කතන්දරයක චරිතයක් නිරූපණය කිරීම.

උදාහරණ : හාවා ගමන් කරන ආකාරය/ මහදැගමුත්තා ගමන් කරන ආකාරය/උකුස්සා වේගයෙන් පියාසර කරන ආකාරය

**12. බෝලය විසි කිරීම හා ඇල්ලීම**

බෝලයක් ඇල්ලීම හා විසි කිරීම සහිත ක්‍රීඩාවකට පෝතක බාලදක්ෂයන් සමග සහභාගී වීම.

**13. ලණු පැනීම (Skipping)**

එක් ස්ථානයක සිට ඉදිරියට 15 වරක් හා පසු පසට 5 වරක් ලණු පැනීම

(නියමිත ප්‍රමිතියට සෑදූ"නසචචසඛට සෑදවැ එකක් භාවිතයෙන්)

**14. ගෙඹි පිම්ම (Leap frog)**

තමාගේ උසට සරිලන ලෙසින් පෝතක බාලදක්ෂයකු සමග ගෙඹි පිම්ම නිවැරදිව පැනීම.

**15. යහපත් සෞඛ්‍යය පුරුදු**

යහපත් සෞඛ්‍ය පුරුදු බ්‍රිස්ටල් බෝඩ් එකක ප්‍රමාණයක ලියා එය පාසලේ ප්‍රදර්ශනය කරමින් සෞඛ්‍යය පෙරහරකට සහභාගී වීම.

**16. පවුලේ තොරතුරු**

තම නිවසේ ලිපිනය හා දුරකථන අංකය වාචිකව ප්‍රකාශ කිරීමට හැකි වීම, තම පවුලේ හා තමාගේ තොරතුරු හා ද ආකේලාට වාචිකව ප්‍රකාශ කිරීම

**17. ආරක්ෂාකාරීව පාරේ ගමන් කිරීම හා නිවැරදිව පාර මාරු වීම**

ආරක්ෂාකාරීව පාරේ ගමන් කිරීම හා නිවැරදිව පාර මාරු වීම දැන සිටීම හා ඒ පිළිබඳ එක්රැස් කර ගත් තොරතුරු ආකේලාට ඉදිරිපත් කිරීම.

**18. ආහාර පිළිගැන්වීම**

හයවල් වශයෙන් ආකේලාගේ සහය ඇතිව සැන්ඩ්විච් /පළතුරු සලාදයක් හෝ පලතුරු කේබාබ් :ඣමසඑ ණැඉඉ* සාදා පිළිගැන්වීම.

**19. බාලදක්ෂ ගීත**

තමාගේ හය සමග කැමති බාලදක්ෂ ගීත 02ක් ගායනා කිරීම.

**20. විධාන**

මෙතෙක් දැනගත් පහත සඳහන් විධාන තවදුරටත් පුරුදු වීම.

i. සීරුවෙන් හා පහසුවෙන් සිටීම
ii. වමට හැරීම
iii. දකුණට හැරීම
iv. ආපසු හැරීම
v. විසිර යාම

**21. වන කථාව**

රැළට ඇතුල් වීමේ සිට කා (පිඹුරා) විසින් මවුග්ලි නිදහස් කර ගැනීම දක්වා වන කථාව දැන සිටීම.

**22. හානියෙන් සුරක්ෂිතතාව**

ලෝකඩ තරුව සඳහා පසුපිටෙහි දක්වා ඇති ලෝකඩ තරුව පදක්කමට අදාළ හානියෙන් සුරක්ෂිතතාව අවශ්‍යතා සපුරාලීම.

**23. මාස 06ක සේවය**

සාමාජික පදක්කම සමත් වූ දිනයෙන් පසු හය මාසයක සේවයක් සම්පූර්ණ කර තිබීම.

**24. අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 01 යි**

පොත් කියවන්නා හෝ චිත්‍ර ශිල්පී

මේ තරුව දිනා ගත හැක්කේ පෝතක බාලදක්ෂයාගේ වයස අවුරුදු 7 යි මාස 8 න් පසුව හා අවුරුදු 11 සම්පූර්ණ වීමට ප්‍රථමයි.

**තවද අනිවාර්ය පදක්කමට අමතරව පහත සඳහන් ප්‍රවීණතා පදක්කම් වලින් ප්‍රවීණතා පදක්කම් 04ක් දිනා ගත හැකිය.**
සංගීතඥයා/විනෝදකරු/රැස්කරන්නා/පාපැදිකරු/මලල ක්‍රීඩක

පෝතක බාලදක්ෂයා මෙම අවශ්‍යතා සාර්ථක ලෙස සපුරා ඇති බවට සහතික කර ලෝකඩ තරුව සඳහා නිර්දේශ කරනුයේ පෝතක බාලදක්ෂ නායකයා හෝ නායිකාව විසිනි.

# රිදී තරුව ප්‍රදානය

## රිදී තරුව ප්‍රදානය සඳහා අවශ්‍යතා
## වයස අවුරුදු 8 මාස 2 සිට අවුරුදු 11 දක්වා

**01. ගිණුම**

ලෝකඩ තරුවේ ඉතිරි කරන ලද මුදල ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම. (ගිණුමක් නැත්නම් නව ගිණුමක් ආරම්භ කිරීම හෝ "කුඩා ඉතිරි කරන්නා" පදක්කම ලබාගැනීම මේ අවශ්‍යතාවය කළ හැක.)

**02. ආගමික කාර්යය**

තම ආගමට අයත් විශේෂ වැඩසටහනකට සහභාගී වීම.

උදා:- පෝයට සිල් ගැනීම, පල්ලියේ නුවාන වැනි මෙහෙයන් වලට සහභාගී වීම,හින්දු පූජාවකට සහභාගී වීම,රාමසාන් උපවාසයේ යෙදීම.

**03. සකසුරුවම්කම හා නිසි පිළිවෙළ**

i. ඇඳුම්

රැළ රැස්වීමක දී පාසල් නිල ඇඳුම හෝ බාලදක්ෂ නිල ඇඳුම සබන් ගා සෝදා වියලීම.

ii. පොත්පත්

පෝතක බාලදක්ෂයා තමාගේ පොත් පත් හා පොත් බෑගය නිසි ලෙස පරිහරණය කිරීමට ඉගෙන ගැනීම.

III. පෝතකට කවරයක් දැමීම හෝ පොත් සලකුණක් :ඉදදනප්රන* සෑදීම.

**04. බොත්තමක් ඇල්ලීම**

ඉඳිකටුවට නූල දමා අවම වශයෙන් සිදුරු 02ක් ඇති බොත්තමක් කුඩා රෙදි කැබැල්ලකට ඇල්ලීම.

**05. සුබ පැතීම**

විවිධ අවස්ථාවලදී සුබ පතන ආකාරය

උදා:- සුබ උදෑසනක්/සුබ රාත්‍රියක්

- සෑම පෝතක බාලදක්ෂයෙක්ම රැළ රැස්වීම අවස්ථාවේ සුබ පැතුම් පතක් නිර්මාණය කිරීම

**06. ගරු කිරීම.**

වැඩිහිටියන්ට ගරු කරන ආකාරය දැන සිටීම.

**07. රුවල් ගැටය**

රුවල් ගැටය නිවැරදිව ගැට ගැසීම හා එහි ප්‍රයෝජන දැන සිටීම.

**08. තේ පිළියෙල කිරීම**

හයවල් වශයෙන් තේ පිළියෙල කිරීම හා නිවැරදිව පිළිගැන්වීම

**09. චාරිකාව**

තමාගේ රැළ සමග පාසල අවට විශේෂ ස්ථානයක් නැරඹීම හා එම ස්ථානවල වැදගත්කම ආකේලාට වාර්තා කිරීම.

උදා :- පොලිසිය/තැපැල් කාර්යාලය/මල් වත්තක්

**10. ජාතික කොඩිය**

ජාතික කොඩියේ ඇතුලත් වර්ණ හා සංකේත වලින් අදහස් වන දේ දැන සිටීම හෝ ජාතික කොඩිය ඔසවන විට සීරුවෙන් සිටීමට දැන සිටීම.

**11. නිරීක්ෂණය (ගස් හා සිවුපාවුන්)**

ගස් වර්ග 03ක් හා සිවුපාවුන් 03ක් නිරීක්ෂණය කර ඒවායේ/එම සතුන්ගේ ස්වාභාවය ගැන කෙටියෙන් ආකේලාට වාචිකව ඉදිරිපත් කිරීම.

**12. නිර්මාණශීලී නිමැවුම**

අපතේ යන ද්‍රව්‍ය හෝ ස්වාභාවික දේවල් උපයෝගී කරගෙන එදිනෙදා ජීවිතයට ප්‍රයෝජනවත් නිර්මාණයක් සෑදීම.

**13. ජන කවි**

තමාගේ රැළ සමග ජන කවි දෙකක් ගායනා කිරීම.

**14. ශ්‍රේෂ්ඨ පුද්ගලයා**

හයවල් වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් පිළිබඳව රංගනයක් ඉදිරිපත් කිරීම.

උදා:- මද්දුම බණ්ඩාර / වීරපුරන් අප්පු / මහාමාන්‍ය ඩී.එස්. සේනානායක/ පණ්ඩිත් ඩබ්ලිව්.ඩී.අමරදේව / ටී.බී.ජයා/ පොන්නම්බලම් රාමනාදන්

**15. බාධක සහිත ගමන**

බාධක සහිත ක්‍රියාකාරකමකට සහභාගී වීම.

උදා : ටයර් වලින් රිංගා යාම, බාධයකින් රිංගා යාම, පුටුවක් යටින් රිංගා යාම.

**16. හුරුබුහුටිකම**
කල් බැලීම හා ගමනේ යාම

**17. නාට්‍ය ගීතයකට රංගනය**
හයවල් සමග නාට්‍ය ගීතයක් රඟපාමින් ගායනා කිරීම.

**18. පිණුම් හෝ කරණම**
දෙවරක් පිනුම් ගැසීම හෝ කරණම් ගැසීම

**19. සමබරතාව**
කිලෝග්‍රෑම් එකක පමණ බරක් (පොතක් හෝ ඔතන ලද ගඩොල් භාගයක් හිස මත තබාගෙන මීටර් 06 ක දුරක් ගමන් කිරීම)(බර ප්‍රමාණය පිළිබඳව ආකේලාට තීරණය කළ හැක.)

**20. විදේශීය බාලදක්ෂ ගීතයක් හෝ ජයඝෝෂාවක්**
විදේශීය බාලදක්ෂ ගීතයක් හෝ ජයඝෝෂාවක් හයවල් වශයෙන් හෝ රැළ වශයෙන් ඉදිරිපත් කිරීම.

**21. වන කථාව**
කා විසින් මවුග්ලි හිඳහස් කිරීමේ සිට සියෝනි වනයට රතු මල ගෙන ඒම දක්වා වන කථාව දැන සිටීම.

**22. දිසා හෝ ජාතික මට්ටමේ ක්‍රියාකාරකම්**
දිසා රැලිකයට පෝතක බාලදක්ෂ දිනයකට, හෝ ජාතික වැඩසටහනකට හෝ කබෝරියකට සහභාගී වීම.

**23. හානියෙන් සුරක්ෂිතතාව**
රිදී තරුව සඳහා පසු පිටෙහි දක්වා ඇති රිදී තරුව පදක්කමට අදාළ හානියෙන් සුරක්ෂිතතාව අවශ්‍යතා සපුරාලීම.

**24. මාස 06 සේවය**
ලෝකඩ තරුව සමත් වූ දිනයෙන් පසුව හය මාසයක සේවයක් තිබීම. රිදී තරුව දිනා ගත හැක්කේ වයස අවුරුදු 8යි මාස 2ට පසුව හා අවුරුදු 11 වීමට ප්‍රථමය. නිවාස සහයක හා ගෙවතු ගොවි පදක්කම් දිනා ගැනීම අනිවාර්ය වේ.
ප්‍රථමාධාරක, මාර්ගෝපදේශක, පසන් නිවැසි හා ජාත්‍යන්තර පදක්කම් හැර තවත් ප්‍රවීණතා පදක්කම් 06 ක් කැමති නම් දිනා ගත හැකිය.

පෝතක බාලදක්ෂයා මෙම අවශ්‍යතා සාර්ථක ලෙස සපුරා ඇති බවට සහතික කර රිදී තරුව සඳහා නිර්දේශ කරනුයේ නායකයා හෝ නායිකාව විසිනි.

# රන් තරුව ප්‍රදානය

## රන් තරුව ප්‍රදානය සඳහා අවශ්‍යතා
## වයස අවුරුදු 9 මාස 6 සිට අවුරුදු 11 දක්වා

**01. පෝතක බාලදක්ෂ භාවනාව**
පෝතක බාලදක්ෂ ආචාර්යවරිය විසින් සංවිධානය කරන ලද සර්ව ආගමික වැඩසටහනකට රැළ සමග සහභාගී වීම.

**02. පින්තූර පොත**
රැළ රැස්වීම අවස්ථාවේ ආකේලා විසින් පෙන්වා දෙන ආකාරයට කොළ සහ මල් වර්ග 10 බැගින් ප්‍රෙස් කර ක්‍රියාකාරම් පොතේ අලවා නම් කිරීම.

**03. සතුටු සේවය**
පාසල ආසන්නයේ විශේෂිත ස්ථානයකට ගොස් සතුටු සේවයක් කිරීම. (පැය 01ක්) උදා : ආගමික ස්ථානයක හෝ පොදු ස්ථානයක අවශ්‍යතාවයක් ඉටු කිරීම)

**04. වටයක් පැටලූ වළලු දෙකේ ගැටය**
වටයක් පැටලූ වළලු දෙකේ ගැටය නිවැරදිව ඉගෙනගැනීම හා එහි ප්‍රයෝජන දැන ගැනීම.

**05. කොස් පට්ටා ගැටය**
කොස් පට්ටා ගැටය නිවැරදිව ඉගෙන ගැනීම හා එහි ප්‍රයෝජන දැන ගැනීම.

**06. ආහාර පිසීම.**
බතල, මඤ්ඤොක්කා, දෙල්, අල හෝ කඩල වැනි දෙයක් තැම්බීම හා පිළිගැන්වීම (කඩල තැම්බීම තෝරා ගන්නේ නම් කලින් පොගවා ගත් කඩල භාවිතා කරන්න.)

**07. ඇඳුම් මැදීම**
රැළ රැස්වීම් දවසේදී කමිසයක් හෝ ගවුමක් මැදීම. (වැඩිහිටි අධීක්ෂණය යටතේ)

**08. ඉන්ද්‍රිය පුහුණු ක්‍රීඩා**
ආකේලා විසින් සංවිධානය කරන ඉන්ද්‍රිය පුහුණු කිරීමේ ක්‍රීඩා 03කට සහභාගී වීම.

**09. පා ගමන හෝ නිදන් සෙවීම.**
ආකේලා විසින් සංවිධානය කරන ලද වරුවක් සඳහා වූ පා ගමන හෝ නිදන් සෙවීමේ ක්‍රීඩාවකට සහභාගී වීම.

**10. වෙළඳ දැන්වීම්**
ධනාත්මක ආකල්ප ලබා දෙන ළමුන්ට උචිත වෙළඳ දැන්වීමක් නිර්මාණය කර තම හය සමග රඟ දැක්වීම

**11. පරිසර ආශ්‍රිත චිත්‍රය**
පරිසරය ආශ්‍රිත චිත්‍රයක් නිර්මාණය කිරීම.
උදා : ගසක්/මුහුදු වෙරළක්/කන්දක්/වෙලක්/මල් ගොමුවක්

**12. ළමා නාට්‍යයක් රඟ දැක්වීම**
තම හයත් සමඟ ආකේලා විසින් දෙන ලද තේමාවක් අනුව ළමා නාට්‍යයක් රඟ දැක්වීම

**13. ගසක හෝ කඹයක නැගීම**
ගසක හෝ කඹයක මීටර් 2ක් උසට නැගීමට හැකි වීම.

**14. ප්‍රථමාධාර**
ද්‍රව්‍යයන් 6ක් අඩංගු ප්‍රථමාධාර කට්ටලයක් සෑදීම.
සුළු තුවාලයකට බෙහෙත් දැමීමට අවශ්‍ය ද්‍රව්‍ය හඳුනා ගැනීම හා ඒවා භාවිතා කිරීමට දැන ගැනීම.

**15. කාර්ය අධ්‍යයනය**
මිතුරකු සමඟ පහත සඳහන් ස්ථාන /ආයතන දෙකක් නැරඹීමට යාම හා ඒවායින් කෙරෙන කාර්යයන් ආකේලාට ඉදිරිපත් කිරීම.
(වැඩිහිටි ආරක්ෂාව සහිතව)

i. පුස්තකාලයක්
ii. කෞතුකාගාරයක්
iii. සත්තු වත්තක්
iv. සුපිරි වෙළඳසැලක්
v. ගම්බද පොළක්
vi. ගොවිපළක්
vii. වඩු මඩුවක්
x. වරාය
xi. පිහිණුම් තටාකයක්
xii. තේ කර්මාන්ත ශාලාව ආදිය

**16. රතු මල**

ආකේලා විසින් සංවිධානය කරන ලද රතු මල වැඩසටහනකට ක්‍රියාශීලිව සහභාගී වීම.

**17. ජය ඝෝෂා**

පෝතක බාලදක්ෂයා ජය ඝෝෂා 3ක් තනිවම ඉදිරිපත් කිරීම.

**18. බී.පී. තුමා (බේඩන් පවෙල් සාමි තුමා)**

බී.පී. තුමා පිළිබඳව පහත කරුණු දැන සිටීම.

- එතුමා උපන් රට
- එතුමාගේ උපන්දිනය
- පෝතක බාලදක්ෂ අංශය ආරම්භ වූ වර්ෂය
- එතුමා අභාවප්‍රාප්ත වූ රට
- පළමු බාලදක්ෂ කඳවුර පැවැත්වූ ස්ථානය

**19. පෝතක නිවාඩු කඳවුර**

රන් තරු අපේක්ෂිත පෝතකයන් නිවාඩු කඳවුරකට සහභාගී වීම. (එක් රාත්‍රියක් ගත කිරීම)

**20. වන කථාව**

රතු මල ගෙන ඒමෙන් පසු කොටියාගේ හම ගෙන ඒම දක්වා දැන සිටීම.

**21. හානියෙන් සුරක්ෂිතතාව**

රන් තරුව සඳහා පසු පිටෙහි දක්වා ඇති රන් තරුව පදක්කමට අදාළ හානියෙන් සුරක්ෂිතතාව අවශ්‍යතා සපුරාලීම.

**22. මාස 06ක සේවය**

රිදී තරුව සමත් වූ දිනයෙන් පසුව මාස 06ක සේවය.

**පසන් නිවැසි, මාර්ගෝපදේශක යන ප්‍රවීණතා පදක්කම් දෙක දිනා ගැනීම අනිවාර්ය වන අතර ප්‍රථමාධාරක පදක්කම හෝ තම කැමති ජාත්‍යන්තර පදක්කමක් දිනා ගැනීමද අනිවාර්ය වේ.**

මෙම තරුව දිනා ගත හැක්කේ වයස අවුරුදු 9 මාස 6 කට පසුව හා අවුරුදු 11 ට ප්‍රථමය.

- රන්තරුව දිනා ගැනීමට මත්තෙන් කලින් දිනා ගත් ප්‍රවීණතා පදක්කම් වලට අමතරව තවත් ප්‍රවීණතා පදක්කම් 8ක් දිනා ගත හැකිය.

- රන්තරුව දිනා ගැනීමෙන් පසුව ඉතිරි ප්‍රවීණතා පදක්කම් සියල්ල වුවද කැමති නම් දිනා ගැනීමට පුළුවනි.
- මෙම තරුව ලැබීමට සුදුසු වන්නේ තම දිසාවේ සහය දිසා කොමසාරිස් (පෝතක) හා පවත්වන සම්මුඛ පරීක්ෂණයෙන් පසුවයි.
- පෝතක බාලදක්ෂයින් ලොග් පොත් භාවිතා නොකරයි. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ පෝතක බාලදක්ෂ අංශය මගින් සාමාජික/ලෝකඩ/රිදී/රන් තරුව සඳහා සකසා ඇති ක්‍රියාකාරකම් පොත් භාවිතා කළ යුතුය.

# ප්‍රවීණතා පදක්කම්

ප්‍රවීණතා පදක්කම් විෂය නිර්දේශය බාලදක්ෂ වෙළඳසැලෙන් ලබා ගත හැකි අතර වෙබ් අඩවියෙන් ද බාගත හැක. පෝතක බාලදක්ෂයා තමා කැමති ප්‍රවීණතා පදක්කම් ලබා ගැනීමේදී එම පදක්කමට අදාළ විෂය නිර්දේශය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. පදක්කම් පරීක්ෂක වෙත ඉදිරිපත් කිරීමේදී පහත කරුණු ගැන සැලකිලිමත් විය යුතුය.


1. නිල ඇඳුමෙන් සැරසී සිටීම.
2. ක්‍රියාකාරකම් පොතේ විෂය නිර්දේශය ලියා තිබීම.
3. විෂය නිර්දේශය පිළිබඳ මනා අවබෝධයක් ලබා තිබීම.

(පෝතක බාලදක්ෂ නායික නායිකාවට සමත් කළ හැක්කේ පසන් නිවැසි ප්‍රවීණතා පදක්කම පමණි)

# හානියෙන් සුරක්ෂිතතාවය - *Safe From Harm*

| | | සාමාජික | ලෝකඩ | රිදී | රන් |
|---|---|---|---|---|---|
| 1 | තමන් හා වටපිටාව පිළිබඳ අවධානය | තමාගේ නම හා හදිසියකදී ඇමතිය හැකි දුරකථන අංකයක් දැන ගැනීම. | තමාගේ ලිපිනය දැන ගැනීම | තමාගේ දෙමව්පියන්ගේ නම් දැන ගැනීම | තමාගේ දෙමව්පියන්ගේ දුරකථන අංක දැන ගැනීම |
| 2 | එකිනෙකා අතර සබැඳියාව | තමාගේ හය සමග මිතුරු වීම | මිත්‍රත්වයේ ඇති වැදගත්කම | යහපත් මිතුරෙක් වන ආකාරය | අයහපත් මිතුරෙකු හඳුනා ගන්නා ආකාරය |
| 3 | ළමයින් හා වැඩිහිටියන් අතර සබැඳියාව | ආකේලා සමග යහපත් සම්බන්ධතාවය | විශ්වාසවන්ත වැඩිහිටියන් සමග පමණක් ඇසුරු කිරීම. | ආකේලා, නිවස, පාසල අතර සම්බන්ධතාවයක් ඇති කර ගැනීම | ආකේලා සමග ප්‍රශ්න හා සැලසුම් කථා කිරීම |
| 4 | | | | | |
| 5 | ශාරීරික ආරක්ෂාව | තනිවී නොසිටීම හා නොදන්නා අය සමග කථාවට නොයාම | යහපත් හා අයහපත් ස්පර්ශ හඳුනාගෙන අයහපත් ස්පර්ශ වලින් වැලකීම | නොදන්නා පුද්ගලයින් සමග කථාවට නොයෑම | ශාරීරික හිංසා හඳුනා ගැනීම හා එවැනි දෙයක් සිදුවූ විට ආකේලාට වාර්තා කිරීම |
| 6 | සිතුවිලි සෞඛ්‍ය හා ආරක්ෂාව | තමන් අකමැති දෙයක් සිදුවූ විට එය තමාගේ වරදින් සිදු නොවූ බව අවබෝධ කර ගැනීම | | ශාරීරික සෞඛ්‍ය නිසි ලෙස පවත්වා ගැනීම | අන් අය සමග නිසි සම්බන්ධතාවය |
| 7 | මානසික ආරක්ෂාව | වඩාත් හොඳින් පැහැදිලි කර ගැනීමට ප්‍රශ්න ඇසීම | සැකහැර දැන ගැනීම | වැරදි වලින් පාඩම් ඉගෙන ගැනීම | තමා තමා වීම |
| 8 | ස්ථාන හා උපකරණ ආරක්ෂිතව භාවිතා කිරීම | අසාමාන්‍යය දෙයක් දුටු විට ආකේලාට පැවසීම | නිවසේ අනතුරු වැලැක්වීම | රැස්වීම් පවත්වන ස්ථානය ආරක්ෂාව | විද්‍යුත් හා ගිනි අනතුරු වලින් ආරක්ෂා වීම |
| 9 | සෞඛ්‍යමත් ජීවිතයකට හුරු කිරීම | ජලය නිසි ලෙස පානය කිරීම<br>දවසට දෙවරක් දත් මැදීම | සමබල ආහාර වේලක් ගැනීම | යහපත් සෞඛ්‍යය පුරුදු දෙකක් දැන ගැනීම | යහපත් සෞඛ්‍යය පුරුදු හතරක් දැන ගැනීම |
| 10 | අන්තර්ජාල ආරක්ෂාව | අන්තර්ජාලය වැඩිහිටියන්ගේ අනුමැතිය ඇතිව භාවිතා කිරීම | | අන්තර්ජාලයේ ඇති යහපත් දේ පමණක් තෝරා ගෙන අයහපත් දේ බොහෝ ඇති බව අවබෝධ කර ගැනීම | |
| 11 | දත්ත ආරක්ෂණය | තමන්ගේ පෞද්ගලික දත්ත අන් අය සමග හුවමාරු නොකිරීම | | | |
| 12 | පුද්ගලික අවංකභාවය | තමා තමාට මෙන්ම අන් අයටත් අවංක වීම | | | |

# පෝතක බාලදක්ෂ වැඩ සටහන





ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

# පෝතක බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් නිර්දේශය

## කායික අංශය




## බුද්ධිමය අංශය





## චිත්තවේගීය අංශය





## සාමාජීය අංශය




## ආධ්‍යාත්මික අංශය




## සංස්කෘතික අංශය



# ජාත්‍යන්තර ප්‍රවීණතා පදක්කම්

**සොබාදම් ශූරයා**
*Champions for Nature*



**සූර්ය ශක්තිය බලගන්වන්නා**
*Scouts Go Solar*




**සාමයේ පණිවිඩකරු**
*Messengers of Peace*




**ප්ලාස්ටික් පිටු දකින්නා**
*Tide Turners Plastic Challenge*




**සාමයේ සංවාදකරු**
*Dialogue for Peace*



# බාලදක්ෂ
# පොරොන්දුව හා නීතිය

## බාලදක්ෂ පොරොන්දුව

මාගේ ආගම සහ රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට ද සෑම කල්හිම අනුන්ට උපකාර කිරීමටද බාලදක්ෂ නීතියට කීකරු වීමටද මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සහය යෙදීමට ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි.

## බාලදක්ෂ නීතිය

01. බාලදක්ෂයා විශ්වාස කටයුතු අයෙකි.
02. බාලදක්ෂයා පක්ෂපාතී අයෙකි.
03. බාලදක්ෂයා හිතෛෂීය, කාරුණික අයෙකි.
04. බාලදක්ෂයා සෑම බාලදක්ෂයෙකුගේම සහෝදරයෙකි.
05. බාලදක්ෂයා ධෛර්ය සම්පන්න අයෙකි.
06. බාලදක්ෂයා සත්ත්ව කරුණාව ඇති අයෙකි.
07. බාලදක්ෂයා සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකි.
08. බාලදක්ෂයා සොම්නස් සහගත අයෙකි.
09. බාලදක්ෂයා සකසුරුවම් අයෙකි.
10. බාලදක්ෂයා සිත, කය, වචනයෙන් පිරිසිදු අයෙකි.

**65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02**
Tel : 0115731050 / 0113231512 / 0112433131
e-mail :slscout1@yahoo.com / srilankascout@ymail.com
Web : www.scout.lk